චක්‍රලේඛ අංක: 08/2012

සියළුම බන්ධනාගාර අධිකාරී සහ
සහකාර අධිකාරීවරුන් වෙත.

<u>ළමා සැකකරුවන් රඳවා තැබීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද අංක 47/97 හා 1997.10.14 දින දරණ චක්‍ර ලේඛනයට අමතර වශයෙනි.

එම චක්‍රලේඛයෙන් ළමා නිවාසවල රඳවා තැබීමට අධිකරණ මගින් නියෝග කරන ළමුන් උසාවි ඉදිරිපත් කිරීමේදී බන්ධනාගාරතුල තාවකාලිකව හෝ රඳවා තැබීමෙන් වැලකී සිටින ලෙසට මා විසින් ආයතන අධිකාරීවරුන් වෙත උපදෙස් දී ඇති නමුත්, සමහර ආයතනභාර නිළධාරීන් ඊට පටහැනිව කටයුතුකර අනවශ්‍ය ලෙස ළමා නිවාසවල රැඳවීමට නියමිත ළමුන් බන්ධනාගාරවල දින ගණනාවක් රඳවා තබා ගෙන ඇති බවට මා වෙත වාර්තා වී ඇත.

තාවකාලිකව හෝ කුඩා ළමුන් බන්ධනාගාරවල රඳවා තැබීමට කටයුතු කිරීමෙන් ළමා අයිතීන් උල්ලංඝණය වනවා පමණක් නොව, විවිධ ඝණයේ අපරාධකරුවන් ද සමග ළමුන්ට එක්ව සිටීමට සැලැස්වීමෙන් එම ළමුන්ට බොහෝ දුරට අගතියක් සිදුවීමට අවකාශ සැලසෙනවා ඇත.

ඉතා දුර බැහැර ආයතනයක් මගින් අධිකරණ වෙත ඉදිරිපත් කිරීම සඳහා රැගෙන එන ළමුන් තාවකාලිකව හෝ බන්ධනාගාරවල රැඳවා තැබීම වෙනුවට ඔබ අධිකරණ බල ප්‍රදේශවල ඇති රජයේ අනුමත ළමා නිවාස සමග සාකච්ඡාකර ඔවුන් එම ආයතනයක තාවකාලිකව රඳවා තැබීමටත්, ඒ සඳහා වන වියදම් ඔබ ආයතනය මගින් ළමා නිවාසය වෙත ගෙවීමටත් කටයුතු කරන ලෙස මෙයින් දන්වමි. ඒ සඳහා කටයුතු කිරීමේදී යම් ගැටළුවක් පවතී නම් ඒ බව මා වෙත දැනුම් දී අවශ්‍ය උපදෙස් ලබාගන්නා මෙන් වැඩි දුරටත් දන්වමි.

21/2/2012

පී.ඩබ්ලිව්.කොඩිප්පිලි
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.
O/C